# <u>නියමයන් හා කොන්දේසි</u>

මම / අපි පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලින් දැඩි සේම බැඳීමට එකඟ වෙමි / වෙමු.

1. මා / අප විසින් පවත්වා ගෙන යනු ලබන කවර ගිණුමකට වුවද බැර කරනු ලබන කවර ණය මුදලකින් වුවද ලැබෙන මුදල් භාවිතා කිරීමෙන් මම / අපි පහත දක්වා ඇති නියමයන් හා කොන්දේසි පිළිගන්නා බවටද ඒවායින් බැඳී සිටින බවටද මම / අපි එකඟ වෙමි / වෙමු.

2. මා / අප වෙත පූර්ව දැනුම්දීමකින් තොරව සිය තනි හා පරම අභිමතය පරිදි කලින් කලට කවර හෝ ණය පහසුකමක් වුවද සමාලෝචනය කිරීමේ හා එය ඉවත් කර ගැනීමේ / අවලංගු කිරීමේ හෝ ආපසු කැඳවීමේ හෝ එයට අදාළ නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට තිබිය යුතු ය.

3. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් තීරණය කරනු ලබන හා ණය මුදල් මුදා හැරීමේදී නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් එවනු ලබන තහවුරු කිරීමේ ලිපියක මා / අප වෙත තහවුරු කෙරෙන අනුපාතයකින් මාසිකව පොළිය ගෙවනු ලැබිය යුතු ය. මා / අප එකී පොළී අනුපාතිකයට එකඟ නොවන්නේ නම්, මා / අප අදාළ ණයමුදලෙන් ලැබෙන මුදල් භාවිතා නොකළ යුතු බවටද, එම ණයමුදල පිළිගැනීමට මාගේ / අපගේ නොහැකියාව පිළිබඳව අනලස්ව (කවර තත්තවයකදී වුවද ඉහත කී තහවුරු කිරීමෙන් දින 7 කට වඩා පමා නොවී) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත දැන්විය යුතු බවටද මම / අපි එකඟ වෙමි / වෙමු. ණය මුදලෙන් ලැබෙන මුදල් භාවිතා කිරීම මා / අප නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් එවනු ලබන අදාළ තහවුරු කිරීමේ ලිපියෙහි  මාසික වාරික මුදල, පොළී අනුපාතිකය හා ආපසු ගෙවීමේ කාලපරිච්ඡේදය පූර්ණ වශයෙන් පිළිගත් බවට තීරණාත්මක සාක්ෂ්‍ය විය යුතු වන අතර එය එහි මාසික වාරික මුදල, පොළී අනුපාතිකය හා ආපසු ගෙවීමේ කාලපරිච්ඡේදය වෙනස් කිරීමට බැංකුවට ඇති අයිතියට යටත්ව හා එයට අගතියකින් තොරව විය යුතුය. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හට සිය අභිමතය අනුව වෙළඳපල තත්ත්වයන් මත රඳා පවතිමින් අදාළ විය යුතු පොළී අනුපාතිකය, මාසික වාරික මුදල සහ ආපසු ගෙවීමේ කාලය වැඩි කිරීමට හෝ අඩු කිරීමට හැකි බවට විශේෂිතවම එකඟ වනු ලැබේ. ණය මුදලෙහි මුල් මුදල සහ / හෝ පොළිය ආපසු ගෙවීම සඳහා වූ වාරික නියමිත දිනයන්හිදී මා / අප විසින් ගෙවනු නොලැබුවහොත්, ප්‍රාමාණීකෘත නාශවන්දි වශයෙන්, සාමාන්‍යයෙන් අදාළ විය යුතු අනුපාතිකයකට වඩා ඉහළ අනුපාතිකයකින් පොළිය අයකිරීමට බැංකුවට හිමිකාරිත්වය තිබිය යුතුය. ණය මුදල මත හෝ ගෙවනු ලබන හෝ ගෙවිය යුතු කවර වුවද පොළියක් මත අදාළ විය යුතු බදු මුදල මා / අප විසින් ගෙවනු ලැබිය යුතු ය.

4. ණයමුදල යටතේ හෝ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම මුදල් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී හි තනි අභිමතය පරිදි මා / අප හට දැනුම්දීමකින් තොරව මා / අප විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි පවත්වා ගෙන යනු ලබන කවර හෝ ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථිර තැන්පතු ගිණුම් වෙතින්, අයිරාවක් නිර්මාණය කරමින් හෝ තිබෙන අයිරා සීමාවක් වැඩි කරමින් පවා ඉහත එකඟ වී ඇති අදාළ නියමිත දිනයන්හිදී ගෙවිය යුතු පොළියද සමගින් හර කිරීමට මම / අපි නේෂන්ස් බැංකුව වෙත අහෝසි කළ නොහැකි ලෙසම බලය පවරමි / පවරමු.

5. එමෙන්ම කවර හේතුවක් නිසා වුවද, මා / අප විසින් ඉල්ලුම් කරන ලද මුදලට වඩා අඩු හෝ වැඩි මුදලක ණයක් ප්‍රදානය කරන ලෙසද මම / අපි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙතින් ඉල්ලුම් කරන අතර භාර ගැනීමටද එකඟ වෙමි / වෙමු. එවැනි අවස්ථාවක මා / අප විසින් ඉල්ලුම් කරන ලද මුදලට වඩා අඩු හෝ වැඩි මුදලක් වූ එම ණය මුදලද  මා / අප වෙතින් තවත් ඉල්ලීමක් හෝ පිළිදැන්වීමක් සඳහා අවශ්‍යතාවකින් තොරව, මෙහි අඩංගු නියමයන් හා කොන්දේසි මගින් පාලනය විය යුතු ය.

6. යම් ආයතනයක හවුල්කරුවන් වශයෙන් හෝ අන්‍යාකාරයකින් වූ තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් හෝ වෙනුවෙන් මෙම ලියවිල්ල අත්සන් කරනු ලබන්නේ නම්, එකී තැනැත්තෝ එක්ව හා වෙන් වෙන්ව ඉහත කී ණයමුදලේ හා පොළියේ ප්‍රමාණය වෙනුවෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත බැරකම දරන අතර, ඉහත කී ණයමුදල හා පොළිය සම්බන්ධයෙන් කවර වුවද මුදල් ප්‍රමාණයන් ගෙවීමට ඇතිනාක් එම එක් එක් තැනැත්තා එකම හෝ ප්‍රධාන ණයගැතියා මෙන් බැරකම දැරිය යුතු ය.

7. ණය මුදලෙහි ගිණුම මා / අප හට දැනුම් දීමකින් තොරව මාගේ / අපගේ අනෙක් ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු (කාල හෝ ඉල්ලුම්) ගිණුම් සියල්ල හෝ කවරක් හෝ සමග සංයුක්ත කිරීමට සහ මාගේ / අපගේ බැරට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි ඇති කවර හා සියලුම මුදල් හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් මා / අප වෙත ලැබිය යුතු, අයවිය යුතු හෝ ගෙවනු ලැබිය යුතු හෝ මින් මතුවට මා / අප වෙත ලැබිය යුතු, අයවිය යුතු හෝ ගෙවිය යුතු වනු ඇත්තා වූ කවර හා සියලුම මුදල් මාගේ / අපගේ තනි පුද්ගල ධාරිතාවයෙන් / ධාරිතාවන්ගෙන් හෝ අන් කවර හෝ ධාරිතාවකින් තනිව හෝ අන් කවර හෝ තැනැත්තකු හෝ සංස්ථාවක් සමග සංයුක්තව මා වෙත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් ලබා දෙන ලද ණයමුදල්, ණයවර, අත්තිකාරම් හෝ වෙනත් මූල්‍යමය ආධාර, සහාය හා බැංකු පහසුකම් වෙනුවෙන් මා / අප විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත මේ වන විට ලබා දීමට හා ගෙවීමට ඇති හෝ මින් මතුවට ලබා දීමට හෝ ගෙවීමට තිබෙනු ඇති කවර හෝ සියලු මුදල් වෙනුවෙන් හිලව් කිරීමට හා යෙදවීමට මම / අපි නේෂන්ස් බැංකුව වෙත අහෝසි කළ නොහැකි ලෙසම බලය පවරමි / පවරමු. මා / අප විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත දෙන ලද එම නිර්බාධිත අයිතිය හා අහෝසි කළ නොහැකි බලය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් ක්‍රියාවේ යෙදවීම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් එම බලය ක්‍රියාවේ යෙදවීමේ දින හෝ එදිනට පෙර මා / අප විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි කවර හෝ කාර්යාලයක් පිට ලියන ලද චෙක්පත්, ඉල්ලීම් හෝ මුදල් ආපසු ගැනීම්, හෝ එවැනි අන් ලියවිලි අගරු කිරීමේ හෝ ගෙවීම ප්‍රතික්ෂේප කිරීමේ මට්ටමට වුවද, එසේත් නැති නම් මාගේ / අපගේ නමින් ඇති කවර හෝ ගිණුමක් වැසීමේ මට්ටමට වුවද සිදු කරනු ලැබිය හැකි අතර මම / අපි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි එබඳු ක්‍රියාමාර්ගවලට ආනුෂංගිකව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. කෙරෙහි කරනු ලබන සියලුම හිමිකම් පෑම් හෝ ඉල්ලීම් කෙරෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. දෝෂමුක්ත කිරීමට ප්‍රතිඥා දෙමි / දෙමු.

8. ඉහත ණයමුදල හා ඒ මත පොලිය සම්බන්ධව මා / අප විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත ලැබිය යුතු මුදල් (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ විධිවිධාන නොතකා මා / අප ගෙන් ආපසු අයකර ගත හැකි විය යුතු අතර එම මුදල් ආපසු අයකර ගැනීම සඳහා මා / අප වෙත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් නඩු පැවරීමට බාධකයක් වශයෙන් (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ විධිවිධාන අධියාචනය නොකරන්නෙමු / නොකරන්නෙමු.

9. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හට කොන්දේසි විරහිතව හෝ නියමයන්ට යටත්ව ඉහත නියමයන් හා කොන්දේසිවලින් කවරක් වුවද ඉවත් කළ හැකි ය.කෙසේ වුවද, එබඳු සෑම ඉවත් කිරීමක්ම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි අයිතිවාසිකම්වලට අගතියකින් තොර විය යුතු අතර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. උචිත යැයි සිතන කවර අවස්ථාවක වුවද එම අයිතිවාසිකම් එබඳු ඉවත් කිරීමක් සිදු කරනු නොලැබුවාක් මෙන් ක්‍රියාවේ යොදවනු ලැබිය හැකිව පැවතිය යුතු ය.

10. මා විසින් ගෙවීම් පැහැර හරින අවස්ථාවක නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හට හිඟහිටි මුදල් ආපසු අයකර ගැනීම සඳහා තුන්වන පාර්ශ්ව එකතු කර ගැනීමේ නියෝජිතයින් පත්

කර ගත හැකි බවට මා / අප එකඟ වන අතර එසේ එකතු කර ගැනීමේ සියලු පිරිවැය ගෙවීමට මම / අපි එකඟ වෙමි / වෙමු.

11. කල් ඇතිව / කොටසක් පියවීම භාර ගනු ලබන්නේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. විසින් සිය තනි අභිමතය මත කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් මත ය.

12. මෙම ණයමුදල වෙනත් මූල්‍ය ආයතනයක් වෙතින් මා / අප ලබා ගෙන ඇති මූල්‍ය පහසුකමක් (පූර්ණ හෝ අර්ධ වශයෙන්) පියවීම සඳහා යැයි මම / අපි දක්වා තිබුණ හොත්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හට අදාළ මූල්‍ය ආයතනය වෙතින් ලැබෙන තහවුරු කිරීමක් මත පදනම්ව සිය තනි අභිමතය පරිදි මාගේ / අපගේ ගිණුම හර කොට, මාගේ / අපගේ පවත්නා බැරකම පියවනු වස් එම ආයතනය වෙත ගෙවීමට හැකි බව මම / අපි වටහා ගෙන එකඟ වෙමි / වෙමු. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. මාගේ / අපගේ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. කෙරෙහි මතුවීමට ඉඩ ඇති සියලුම හිමිකම් පෑම් හෝ ඉල්ලීම් කෙරෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. දෝෂමුක්ත කිරීමට හා දෝෂමුක්තව තැබීමට මම / අපි එකඟ වෙමි / වෙමු.

13. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. සිය තනි අභිමතය මත උචිත යැයි සලකන කාර්යයක් උදෙසා මා / අප සම්බන්ධයෙන් සහ / හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. සමග සහ / හෝ එහි කවර හෝ ශාඛා සමග වූ මාගේ / අපගේ ගනුදෙනු හෝ ගිණුම් සම්බන්ධයෙන් වූ තොරතුරු අනාවරණය කිරීමට මම / අපි මෙයින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. වෙත බලය පවරමින් කැමැත්ත ලබා දෙමි / දෙමු.

14. මෙය අත්සන් කිරීමට පෙර මා / අප වෙත මෙම නියමයන් හා කොන්දේසි ලබා දෙනු ලැබූ බවත්, තේරුම් කර දෙන ලද බවත්, එමෙන්ම මම / අපි එකී නියමයන් හා කොන්දේසි කියවා අවබෝධ කර ගත් බවත් මම / අපි තහවුරු කර සිටිමි / සිටිමු.

    මෙහි අත්සන් කිරීමට පෙර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. හි පුද්ගලික ණය මුදල්වලට අදාළ වන මෙම නියමයන් හා කොන්දේසිවල පිටපත්, එම නිෂ්පාදනයට අදාළ විස්තරද සමගින් ලබා දී මාගේ / අපගේ තෝරාගත් භාෂාවෙන් මා / අප හට තේරුම් කරනු ලැබූ බවත්, මා / අප එකී විස්තර සහ නියමයන් හා කොන්දේසි කියවා තේරුම් ගත බවත්, ඒවාට එකඟ හා ඒවායින් බැඳීමට කැමති වන බවත් මම / අපි මෙමගින් තහවුරු කර සිටිමි.

| | | | |
|---|---|---|---|
| …………………………… | …………… | …………………………… | …………………..... |
| මූලික අයදුම්කරුගේ අත්සන | දිනය | බද්ධ අයදුම්කරුගේ අත්සන | දිනය |

**සාක්ෂිකරුවෝ**

| | |
|---|---|
| අත්සන: | අත්සන: |
| නම : | නම : |
| ලිපිනය: | ලිපිනය: |
| ජාතික හැඳුනුම්පත් අංකය: | ජාතික හැඳුනුම්පත් අංකය: |